# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2026
# සියලුම ඇගයීම් පරීක්ෂක අයදුම්කරුවන් සඳහා
# අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ උපදෙස්

**ඉතා වැදගත් :- * ඉල්ලා ඇති සියලු තොරතුරු නිවැරදිව සම්පූර්ණයෙන් සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

*** උත්තර පත්‍ර පරීක්ෂකවරයෙක් ලෙස ඔබ තෝරාගනු ලැබුවහොත් ඒ අනුව පිරිනමන පත්වීම මෙවර විභාගයේ ඇගයීම් කටයුතු සඳහා පමණක් වලංගු වන අතර එය ඉදිරි ඇගයීම් කටයුතු සඳහා සම්බන්ධ වීමට හිමිකමක් නොවේ.**

01. අයදුම්පත සම්පූර්ණ කිරීම

1.1 පහත සඳහන් සුදුසුකම් සපුරාලන, දැනට අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති පාසල්වල සේවයේ නියුතු ගුරුභවතුන්ට සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයේ උත්තර පත්‍ර ඇගයීම් සම්බන්ධව පළපුරුද්ද සහිත ගුරු උපදේශකවරුන්ට හා ගුරු සේවයේ සම්පත් පුද්ගලයන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකි ය.

(අ) ඉල්ලුම් කරන ලද විෂයය උපාධියට හෝ ඩිප්ලෝමාවට හදාරා තිබීම සහ එම විෂයට අදාළව ගුරුවරයෙකු ලෙස විධිමත් පත්වීමක් ලබා තිබීම.

(ආ) අ.පො.ස. (උ/පෙළ) (12, 13 ශ්‍රේණිවලට) ගුරුවරයෙකු ලෙස ඉගැන්වීමේ කටයුතු වල නිරත වීම හෝ උපදේශකවරයෙකු/ ගුරු සේවයේ සම්පත් පුද්ගලයෙකු ලෙස අ.පො.ස. (උ/පෙළ) විෂය නිර්දේශ වලට අදාළ රාජකාරිවල නිරත වීම.

* ඉංග්‍රීසි මාධ්‍යය සහ (73) ඉංග්‍රීසි විෂය සඳහා නියමිත සුදුසුකම් සහිත, දේශීය විෂය නිර්දේශය උගන්වන, පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසල්වල ගුරුභවතුන්ට ද අයදුම් කළ හැකි ය.

1.2 Step - 3 යටතේ ඉල්ලුම්කරන ලද විෂයට අදාළ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. එසේ සඳහන් කිරීමට අපොහොසත් වන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.3 Step - 5 යටතේ සඳහන් තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වන අතර එසේ නොකරන ලද අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* දැනට ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වේ නම් හෝ ඔබ විභාග තහනමකට ලක්වූ අයකු නම් හෝ අයදුම්පත්‍ර ඉදිරිපත් කළ නොහැකි ය.

1.4 ඔබ හෝ ඔබගේ පවුලේ සාමාජිකයෙකු විභාගයට ඉදිරිපත් වේ නම් ඔබට ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ නොහැකි ය. පවුලේ සාමාජිකයකු යනුවෙන් අදහස් කරන්නේ ඔබගේ දරුවන් හෝ දරුවන්ගේ දරුවන් හෝ ඔබගේ හෝ කලත්‍රයාගේ දෙමාපියන් හෝ සොයුරු සොයුරියන් හෝ ඔවුන්ගේ දරුවන් හෝ ඔබගේ නේවාසිකයන් වේ.

1.5 විෂයයන් දෙකක් සඳහා අයදුම්කළ හැක්කේ පහත සඳහන් විෂය සංයෝජනයන් සඳහා පමණි.

**(10) සංයුක්ත ගණිතය**
- (11) උසස් ගණිතය
- (07) ගණිතය

**(02) රසායන විද්‍යාව**
- (67) තාක්ෂණවේදය සඳහා විද්‍යාව

**(08) කෘෂි විද්‍යාව**
- (18) කෘෂි තාක්ෂණවේදය
- (66) ජෛව පද්ධති තාක්ෂණවේදය

**(65) ඉංජිනේරු තාක්ෂණවේදය**
- (14) සිවිල් තාක්ෂණවේදය
- (15) යාන්ත්‍රික තාක්ෂණවේදය
- (16) විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය

1.6 අයදුම්පත්‍ර යොමුකළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. රජයේ පාසල් ගුරුවරුන්ගේ අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට (Online) විදුහල්පති විසින් නිර්දේශ කර මාර්ගගත ක්‍රමයට (Online) මෙම දෙපාර්තමේන්තුවට යොමු කළ යුතු අතර, නිර්දේශිත අයදුම්පත් පිළිබඳ සාරාංශ වාර්තාව විදුහල්පති/ ආයතන ප්‍රධානියා විසින් සහතික කර අවශ්‍ය අවස්ථාවක දී ඉදිරිපත් කිරීම සඳහා පාසලේ ගොනුකර තැබිය යුතු ය. **නවක අයදුම්කරුවන්ගේ පමණක් අයදුම්පත්‍රවල දෘඪ පිටපත් අදාළ සුදුසුකම් සනාථ කරන සහතිකවල සහතික කරන ලද පිටපත් සමග අමුණා මෙම දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු ය.**

1.7 පූර්වෝක්ත විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් මධ්‍යස්ථාන පහත දක්වා ඇති ස්ථානවල පිහිටුවීමට යෝජිතය. (ඇගයීම් කාලසීමාව දින 14 ක් පමණ වේ.)

| | | |
|---|---|---|
| 01. කොළඹ | 15. රත්නපුරය | 35. අනුරාධපුරය |
| 02. මහරගම | 20. බදුල්ල | 38. කෑගල්ල |
| 08. හොරණ | 25. ගාල්ල | 41. මහනුවර |
| 10. කළුතර | 27. මාතර | 50. මඩකලපුව |
| 12. මීගමුව | 30. කුරුණෑගල | 51. වවුනියාව |
| 13. ගම්පහ | 32. කුලියාපිටිය | 53. යාපනය |

**සැ.යු. * ප්‍රමාණවත් අයදුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබෙන නගරවල ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවනු නොලැබේ. එබැවින් දෙවන කැමැත්ත ද සඳහන් කළ යුතු ය.**

*** උත්තර පත්‍ර ඇගයීම් කරන කාලය තුළ විභාග දෙපාර්තමේන්තුව මගින් නවාතැන් පහසුකම්, ප්‍රවාහන පහසුකම් හෝ මුදල් අත්තිකාරම් සපයනු නොලැබේ.**

02. අයදුම්පත බාගත කිරීම

2.1 සියළුම රජයේ පාසල්වල ගුරුභවතුන් **විදුහල්පති නිර්දේශයෙන්** පසු තම අයදුම්පත බාගත කර පිටපතක් තමා සතුව තබා ගැනීම අනිවාර්ය වේ.

2.2 **නවක අයදුම්කරුවන් පමණක්** බාගත කරන ලද අයදුම්පත, Step - 3 යටතේ සඳහන් කරන ලද සුදුසුකම් සනාථ කරන සහතික පිටපත් හා ගුරු සේවයේ පත්වීම් ලිපියේ පිටපතක් විදුහල්පති මගින් සත්‍යාපනය කර ඇමුණුම් සහිතව විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු අතර **එහි ඇමුණුම් සහිත එක් පිටපතක් ගොනු කර තැබීම සඳහා පාසල වෙත භාර දිය යුතුය.**

03. අයදුම්පත සහතික කිරීම,

ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති විසින් ද, කලාප කාර්යාලවලට අනුයුක්ත ගුරු උපදේශකවරුන්ගේ, සම්පත් පුද්ගලයන්ගේ අයදුම්පත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, කොට්ඨාස කාර්යාලවලට අනුයුක්ත ගුරු උපදේශකවරුන්ගේ අයදුම්පත්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියා විසින් ද සහතික කළ යුතු ය.

**04. අයදුම්පත සහතික කිරීම සඳහා උපදෙස් (විදුහල්පති / ආයතන ප්‍රධානියා)**

4.1 අයදුම්කරු මාර්ගගතව (Online) සඳහන් කරන ලද තොරතුරු නිවැරදිදැයි ඔබ විසින් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතු ය.

4.2 අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු නිවැරදි බව නිර්දේශ ලබා දෙන අවස්ථාවේ දී වෙන් වෙන් ව සහතික කළ යුතු ය.

4.3 රජයේ පාසල් ගුරුවරුන් සඳහා මාර්ගගතව අයදුම්පත් සත්‍යාපනය කරන අවස්ථාවේ Verification status හි සඳහන් කරුණු යටතේ හා අයදුම්කරු රජයේ පාසල් ගුරුවරයෙක් නොවන විට ඔහු/ ඇය පිළිබඳ ව ඔබේ තක්සේරුව අයදුම්පත්‍රයේ අදාළ කොටුව තුළ නියමිත අක්ෂරය සටහන් කිරීමෙන් දැක්විය යුතු ය.

A - විශිෂ්ටයි   B - හොඳයි   C - සාමාන්‍යයි   W - දුර්වලයි

4.4 මෙය රහස්‍ය වාර්තාවකි. සියලුම රජයේ පාසල් ගුරුභවතුන්ගේ අයදුම්පත් ඔබ විසින් මාර්ගගත ක්‍රමයට (Online) දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු ය.

01. එසේම සම්පූර්ණ කරන ලද සියලුම අයදුම්පත්‍ර සහතික කිරීමෙන් පසු උපලේඛනය බාගත කර (Downloaded) තම කාර්යාලයේ සුරක්ෂිතව තබාගත යුතු ය. (නවක අයදුම්කරුවන්ගේ නම් අදාළ ඇමුණුම් ද සහිතව)

02. නවක සහ රජයේ පාසල් ගුරුවරුන් නොවන අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර අවශ්‍යතාවය පරිදි අදාළ ඇමුණුම් සහිතව ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''උත්තරපත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා අයදුම්පත්‍ර, අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2026''** ලෙස සඳහන් කර පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

සියලුම අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනය 2026.06.22 බව සලකන්න.

**විභාග කොමසාරිස් ජනරාල්**
**පාසල් විභාග ඇගයීම් ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 1503,**
**කොළඹ.**